**සූරියවැව ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 23 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 14 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2. අහිතකර මතය
**----------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට සූරියවැව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-----------------------------------------**

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම
**------------------------------------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය අවසානයට සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුමේ ශේෂය රු. 11,872,890 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද ලෙජර් ගිණුම අනුව එය රු. 10,043,576 ක් වුයෙන් රු. 1,829,314 ක වෙනසක් විය.

(ආ) වර්ෂය අවසානයට කුලී පාලන ගිණුමේ ශේෂය රු. 1,385,911 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණද ලෙජර් ගිණුම අනුව එය රු. 1,145,600 ක් වුයෙන් රු. 240,311 ක වෙනසක් විය.

(ඇ) ණය හිමියන් හා ණය ගැතියන් ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. කර්මාන්ත ණයහිමි හා ණයගැති ගිණුමට රු. 15,588,004 ක මුදලක් බැර හා හර කර තිබුණද ඒ සඳහා ජර්නල් සටහනක් නොතිබුණි.

ii. ජර්නල් සටහන් අංක 34 මගින් රු. 4,710,019 ක මුදලක් කර්මාන්ත ණයහිමි ගිණුම

බැරකර ඇති බව දක්වා තිබුණද එයට පටහැනිව ප්‍රධාන ලෙජරයේ ණයහිමි ගිණුම හරකර තිබූ අතර ජර්නල් සටහන් අංක 14 මගින් රු. 1,205,216 ක මුදලක් කර්මාන්ත ණයගැති ගිණුම හර කර ඇති බව දක්වා තිබුණද එයට පටහැනිව ප්‍රධාන ලෙජරයේ ණයගැති ගිණුම බැරකර තිබුණි.

iii. 2012 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් යටතේ වෙන් කිරීම් කර නොතිබුණද 2012 වර්ෂයට අදාලව කොම්පෝස්ට් ව්‍යාපෘතියේ වැට සකස් කිරීම වෙනුවෙන් 2013 පෙබරවාරි 05 දින ලැබී තිබූ රු. 925,897 ක මුදලක් ණයගැති ගිණුමට බැරකර තිබුණි.

iv. 2012 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් හා ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබූ , 2013 වර්ෂයේ ගෙවීම් නොකරන ලද හා ප්‍රතිපූර්ණය නොවූ රු. 2,498,647 ක් වටිනා කර්මාන්ත 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට ණයහිමියන් හා ණයගැතියන් යටතේ ගිණුම්ගත කර නොතිබූ අතර එයට හේතු දක්වා නොතිබුණි.

v. 2012 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමියන් යටතේ වෙන්කිරීම් කර නොතිබුණද සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කර තිබූ එකතුව රු. 488,559 ක මුදලක් කර්මාන්ත ණයහිමියන්ට හරකර තිබුණි.

vi. 2012 දෙසැම්බර් 31 දිනට ණයහිමියන් හා ණයගැතියන් යටතේ දක්වා තිබූ කර්මාන්ත 05 කට අදාල වටිනාකම් 2013 වර්ෂය ආරම්භයට ඉදිරියට ගෙන යාමේදී එකතුව රු. 234,810 ක වෙනසක් තිබූ අතර එම වෙනසට හේතු වූ කරුණු දක්වා ගිණුම් වලට ගැලපීම් කිරීමට ක්‍රියාකර නොතිබුණි.

vii. මග නැගුම 2012 වැඩසටහන යටතේ 2012 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 18 ක් වෙනුවෙන් රු. 9,502,757 ක මුදලක් ණයහිමියන් හා ණයගැතියන් යටතේ දක්වා තිබූ අතර එම කර්මාන්ත සඳහා රු. 9,295,098 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී ගෙවීම් කර තිබුණි. ඒ අනුව අයි වෙන් කිරීම් කර තිබූ රු. 207,659 ක මුදල ගිණුම් වලට ගැලපීමට ක්‍රියාකර නොතිබුණි.

(ඇ) මගනැගුම වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබූ රු. 13,308,418 ක් වූ කර්මාන්ත 27 ක වටිනාකම ප්‍රාග්ධන ආදායමක් හා ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම තැබීම සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

i. 2012 වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුළු උසාවි දඩ මුදල රු. 1,721,315 ක් විය. මෙම මාස වලට අදාලව 2013 අගෝස්තු 18 දින රු. 1,278,715 ක මුදලක් ලැබී තිබූ අතර වැඩිපුර වෙන් කිරීම් කර තිබූ රු. 442,600 ක උසාවි දඩ මුදල ගිණුම් වලට ගැලපීමට ක්‍රියාකර නොතිබුණි.

ii. 2013 අප්‍රේල් , මැයි ,ජුනි හා ජුලි මාස වලට අදාලව ඇඹිලිපිටිය අධිකරණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ එකතුව රු. 41,083 උසාවි දඩ මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

iii. වර්ෂය ආරම්භයට ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස රු. 27,500 ක මුදලක් දක්වා තිබූ අතර 2010 හා 2012 වර්ෂ වලට අදාලව එකතුව රු. 133,800 ක මුද්දර ගාස්තු ලැබී තිබුණි. මෙම මුදල ආදායම් ණයගැතියන්ට බැරකර තිබූ අතර අඩුවෙන් වෙන්කර තිබූ රු. 106,300 ක මුදල ගිණුම් වලට ගැලපීමට ක්‍රියාකර නොතිබුණි.

iv. මුද්දර ගාස්තු ලිපිගොනුව අනුව සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාලව ලැබිය යුතුව තිබූ එකතුව රු. 56,500 ක මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගතකර නොතිබුණි.

(ඊ) වර්ෂය ආරම්භයට මුලා ප්‍රකාශන අනුව ස්ථාවර තැන්පත් ගිණුම් වල වටිනාකම රු. 5,419,263 ක් වුවද ප්‍රධාන ලෙජරයේ ලෙජර් ගිණුමේ එය රු. 4,000,000 ක් ලෙස දක්වා තිබුණි. මෙම ශේෂ දෙක අතර වෙනස රු. 1,419,263 ක මුදල ජර්නල් සටහන් අංක 17 මගින් පෙර වර්ෂ වලට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම සමුච්චිත අරමුදල ගැලපීම ලෙස දක්වා එම මුදල ස්ථාවර තැන්පත් ආයෝජන ගිණුම හරකර සමුච්චිත අරමුදල් ගිණුම බැරකර තිබුණි. මෙම පොලී ආදායම ඉකුත් වර්ෂවල ආදායමට ගෙන තිබු අතර නැවත වරක් මෙම වර්ෂය තුලද ආදායමට ගැනීම නිසා සමුච්චිත අරමුදල වැඩි වී තිබුණි.

(උ) දැන්වීම් පුවරු ගාස්තු ආදායම් ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. 2013 පෙබරවාරි 11 දින අංක 11981 දරන ලදුපතින් 2012 වර්ෂයට අදාල දැන්වීම් පුවරු ගාස්තු ලෙස පෞද්ගලික ආයතනයකින් රු. 223,782 ක මුදලක් ලැබී තිබුණි. මෙම මුදල 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණද ආදායම් ණයගැතියන්ට බැරකර තිබුණි.

ii. වර්ෂය තුල දැන්වීම් පුවරු ගාස්තු ආදායම් ලෙස රු. 603,913 ක මුදලක් ලැබී තිබු අතර මෙම මුළු මුදලම ආදායමට ගතයුතු වුවත් එසේ නොකර රු. 72,513 ක මුදලක් පමණක් ආදායමට ගෙන තිබු අතර ඉතිරි රු. 531,400 ක මුදල ණයගැතියන්ට බැරකර තිබුණි. වර්ෂය අවසානයට ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු ලෙස එකතුව රු. 557,700 ක මුදලක් පැවති අතර එය ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂ වලට අදාලව දරන ලද එකතුව රු. 231,282 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(එ) පුස්තකාල පොත් ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් සහ පරිත්‍යාග ලෙස ලැබුණු පුස්තකාල පොත්වල වටිනාකම රු. 220,453 ක් වුවද වර්ෂයේ වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණේ රු. 3,730 ක් පමණි.

ii. සමාලෝචිත වර්ෂය තුල මිලදීගත් රු. 203,360 ක් වටිනා පුස්තකාල පොත් වල වටිනාකම ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කළයුතු වුවත් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඒ) ආපසු ගෙවිය යුතු තැන්පත් ගිණුම් තැබිම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. 2014 ජනවාරි හා පෙබරවාරි මාස වලදී තැන්පත් කරන ලද එකතුව රු. 581,113 ක කර්මාන්ත අතරුඳවුම් මුදල් , සදොස් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට රැඳවුම් තැන්පත් ලෙස දක්වා තිබු රු. 1,048,981 ක වටිනාකම තුලට ඇතුළත් කර තිබුණි.

ii. ජර්නල් සටහන් අංක 11 මගින් උපලේඛනය හා ගිණුම අතර ඇති වෙනස ගැලපීම ලෙස දක්වමින් රු. 632,581 ක මුදලක් රැඳවුම් තැන්පත් ගිණුම හරකර සමුච්චිත අරමුදල් ගිණුම බැරකළ බව දක්වා තිබුණද ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබු මෙම ගිණුම දෙකටම රු. 632,581 ක් බැගින් බැරකර තිබු අතර හර සටහනක් නොවීය.

iii. ජර්නල් සටහන් අංක 12 මගින් උපලේඛනය හා ගිණුම අතර ඇති වෙනස ගැලපීම ලෙස දක්වමින් රු. 88,500 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් ගිණුම හරකර සමුච්චිත අරමුදල් ගිණුම බැරකළ බව දක්වා තිබුණද ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබු මෙම ගිණුම් දෙකටම රු. 88,500 ක් බැගින් බැරකර තිබු අතර හර සටහනක් නොවීය.

iv. සේවක ඇප තැන්පත් වෙනුවෙන් වර්ෂය අවසානය වන විට ලැබී තිබු රු. 111,056 ක පොලී මුදල සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුම හරකර තිබුණද එම මුදල සේවක ඇප තැන්පත් වගකීම් ගිණුම බැර නොකර සේවක ඇප පොලී ගිණුම ලෙස දක්වා වෙනම ගිණුමකට බැරකර තිබුණි.

මෙම මුදල ශේෂ පත්‍රයේ වත්කම් යටතේ හර ශේෂයක් ලෙස දක්වා ආයෝජන වලට එකතු කර ගිණුම්ගත කර තිබුණි.

v. මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය අවසානයට සේවක ඇප තැන්පත් ආයෝජන ගිණුමේ වටිනාකම රු. 411,685 ක් වුවද සේවක ඇප තැන්පත් වගකීම් ගිණුමේ වටිනාකම රු. 337,057 ක් විය. ඒ අනුව මෙම ශේෂ දෙක අතර රු. 74,628 ක වෙනසක් විය. මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ඇප තැන්පත් වගකීම් ගිණුමේ වර්ෂය ආරම්භයට රු. 235,888 ක බැර ශේෂයක් තිබූ මුත් ප්‍රධාන ලෙජරයේ පවත්වාගෙන ගොස් තිබූ සේවක ඇප තැන්පත් ගිණුමේ වර්ෂය ආරම්භයට බැර ශේෂය රු. 245,957 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු. 10,069 ක වෙනසක් නිරීක්ෂණය විය.

vi. එකතු කළ අගය මත බදු ගිණුමේ වර්ෂය ආරම්භයට රු. 24,309 ක බැර ශේෂයක් තිබූ අතර මෙය ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබූ එකතු කළ අගය මත බදු ගිණුමට ගැලපීමේදී වර්ෂය ආරම්භයට රු. 24,399 ක හර ශේෂයක් ලෙස ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඔ) සභාවට අයත් කඩකාමර බදුදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල එක්වන් මුදල් ලෙස ලැබුණු එකතුව රු. 235,650 ක මුදල ප්‍රාග්ධන ආදායම් යටතේ ගිණුම්ගත කළයුතු වුවත් එසේ නොකර 5/22 කුලී ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඕ) මූල්‍ය ප්‍රකාශන වල සමාලෝචිත වර්ෂය අවසානයට අයකරගත හැකි උපයෝගී සේවා යටතේ හිඟ ආදායම් ලෙස රු. 1,385,912 ක මුදලක් දක්වා තිබූ නමුත් ලේඛන අනුව වර්ෂය අවසානයට හිඟ ආදායම් වල එකතුව රු. 1,729,712 ක් විය. ඒ අනුව හිඟ ආදායම් රු. 343,800 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇති බව නිරීක්ෂණය විය.

(ක) ලිපිද්‍රව්‍ය හා විදුලි උපකරණ තොග ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. ජර්නල් සටහන් අංක 28 මගින් වර්ෂය ආරම්භයට පැවැති රු. 170,632 ක් වූ විදුලි උපකරණ තොගයේ වටිනාකම සැපයුම් හා උපකරණ ගිණුම (503) හරකර ඇතැති විදුලි උපකරණ තොග ගිණුම බැරකළ බව දක්වා තිබුණි. ප්‍රධාන ලෙජරයේ පවත්වා තිබූ සැපයුම් හා උපකරණ (503) ගිණුමට මෙම මුදල හර කිරීම වෙනුවට සදොස් ලෙස බැරකර තිබූ අතර අතැති විදුලි උපකරණ තොග ගිණුමට බැර කිරීමද සිදුකර නොතිබුණි.

ii. වර්ෂය අවසානයට ඉතිරි විදුලි උපකරණ තොගයේ වටිනාකම රු. 111,582 ක මුදල විදුලි උපකරණ තොග ගිණුම හරකර තිබුණද සැපයුම් හා උපකරණ (503) ගිණුම බැරකර නොතිබුණි. මෙම ගනුදෙනුව ගිණුම්ගත කිරීම සඳහා ජර්නල් සටහනක්ද ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

----------------------------------

ලෙජර් ගිණුමේ සඳහන් සංඛ්‍යා එයට අදාල ලේඛන වල සඳහන් සංඛ්‍යා සමඟ නොසැසඳෙන වටිනාකම ගිණුම් වලට ගැලපීම බව දක්වමින් එකතුව රු. 6,571,165 ක මුදලක් සමුච්චිත අරමුදල හරකර ණයහිමි ගිණුම, කර්මාන්ත ණයගැති ගිණුම හා පොදු ණයගැති ගිණුම් බැරකර තිබූ අතර එකතුව රු. 1,366,361 ක මුදලක් රැඳවුම් තැන්පත් , ටෙන්ඩර් තැන්පත් , ආරක්ෂිත ඇප තැන්පත් හා කුලී පාලන ගිණුම හර කර සමුච්චිත අරමුදල බැරකර තිබුණි. සමුච්චිත අරමුදලට කරනු ලැබූ මෙම හර හා බැර කිරීම් වලට අදාලව උපලේඛනයක් හෝ විස්තර හා පැහැදිලි කිරීම් කිසිවක් ඉදිරිපත් නොකෙරුණු බැවින් එම ගනුදෙනු සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,445,876 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,396,253 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 1,502 | 1,237 | 36 |
| බදුකුලී | 17,116 | 9,883 | 1,693 |
| බලපත්‍ර ගාස්තු | 862 | 215 | 4 |
| වෙනත් ආදායම් | 13,570 | 12,416 | 2,520 |

#### 2.2.2 වරිපනම් බදු

සභා බල ප්‍රදේශයේ දියුණු ප්‍රදේශ වශයෙන් සැලකෙන ප්‍රදේශ ඇතුළත පිහිටි දේපල වලින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාර වරිපනම් බදු තක්සේරු කර අයකිරීමට ක්‍රියාකර නොතිබුණි.

#### 2.2.3 සතිපොළ හා මාළු වෙළඳ සැල බදුදීම

(අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාර සූරියවැව සතිපොළ හා මාළු වෙළඳසැල සහ වෙනිවැල්ආර සතිපොළ ටෙන්ඩර් කර බදුදීමට ක්‍රියාකර නොතිබුණි.

**(ආ)** මෙම සතිපොළ හා මාළු වෙළඳ සැල බදු ගැනීම සඳහා පහත සඳහන් පරිදි මිළ ගණන් ලැබී තිබුණි.

| ඉල්ලුම්කරුගේ නම | ඉල්ලුම් පත්‍රය සභාවට ලැබුණු දිනය | ඉල්ලුම් කළ මුදල | වෙනත් කරුණු |
|---|---|---|---|
| | | රු. | |
| ඩී.එෆ්. නිල්මිණී මිය | 2013.01.02 | 8,000,000 | වර්ෂය සඳහා |
| ඩබ්.පී. චන්ද්‍රසේන මයා | 2013.01.09 | 9,100,000 | පෙබරවාරි සිට මාස 11 ක් සඳහා |
| ඒ.පී.ඩී. රුවන් කුමාර මයා | 2013.01.09 | 7,300,000 | - එම - |
| එන්.එච්.එස්. අජිත් ශ්‍යාමල් මයා | 2013.01.09 | 8,300,000 | - එම - |

❖ සතිපොළ හා මාළු වෙළඳ සැල ඉහත සඳහන් පරිදි ඉල්ලුම්කර තිබූ ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර සභාව වෙත ඉදිරිපත් කර සභා තීරණයක් ගෙන නොතිබුණි.

❖ ඉහත ඉල්ලුම්පත්‍ර අනුව 2013 පෙබරවාරි මස සිට බදු ගැනීම සඳහා ඩබ්.පී. චන්ද්‍රසේන මයා විසින් රු. 9,100,000 ක මුදලක් ඉදිරිපත් කර තිබූ අතර සභාව විසින් කොමිස් ගෙවීමේ පදනම මත 2013 පෙබරවාරි සිට දෙසැම්බර් 31 දක්වා එකතු කර තිබූ මුළු ආදායම රු. 7,791,260 ක් විය. එයින් කොමිස් ලෙස රු. 1,366,882 ක මුදලක් බදු එකතු කරනු ලබන අයට ගෙවා තිබුණි. ඒ අනුව මෙම සතිපොළ හා මාළු වෙළඳ සැල ටෙන්ඩර් කර බදුදීමට ක්‍රියා නොකිරීම නිසා සභාවට රු. 2,675,622 ක අලාභයක් සිදුව තිබුණි.

**2.2.4 මස් කඩ බදු**

සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ඌරුමස්කඩය බදුදී තිබූ බදුකරු විසින් බදු මුදල් නිසි පරිදි ගෙවා නොතිබූ අතර රු. 11,125 ක මුදලක් ගෙවීම පැහැර හැර තිබුණි. මෙම හිඟ බදු මුදල් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.5 සූරියවැව සතිපොළ කඩකාමර 26 බදුදීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ)** පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 05 ඡේදය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි.

(ආ) කඩකාමර 10 කට අදාලව ගිවිසුම් හෝ ලිපිගොනු ඉදිරිපත් නොවීය.

(ඇ) කඩ කාමර 05 කට අදාලව ගිවිසුම අනුව මාසික බදුකුලිය රු. 100 ක් වුවද වර්තමානයේ අයකරන මාසික බදු කුලිය රු. 275 ක් වූ අතර අනෙකුත් කඩකාමර 21 කට අදාල ගිවිසුම්වල මාසික කුලිය කොපමණද යන්න සඳහන් කර නොතිබුණි.

**(ඈ)** එකතුව රු. 332,675 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ඉ)** තක්සේරු දෙපාර්තමේන්තුවේ 2013 මැයි 23 දිනැති තක්සේරු වාර්තාව අනුව මාසික කුලිය රු. 1,000 ක් වුවත් තක්සේරු වාර්තාවේ ගාස්තු අනුව අයකිරීම් කර නොතිබුණි.

(ඊ) පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 4 ඡේදය අනුව, එක්වන් මුදල් සම්බන්ධව කටයුතු කර නොමැති අතර සභාව මගින් කඩහිමියන් වෙත 2008 දෙසැම්බර් 23 දින නිකුත් කරන ලද ලිපිය අනුව හිඟ එක්වන් මුදල් මාසික වාරික 12 කින් ගෙවා අවසන් කරන ලෙස දැනුම්දී තිබුණි. විගණිත දිනය වූ 2013 දෙසැම්බර් 31 දින වන විටත් එක්වන් මුදල් ලෙස එකතුව රු. 444,509 ක මුදලක් අයවීමට තිබුණි. එම මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) සූරියවැව සතිපොළ භූමියේ 2013 නොවැම්බර් 21 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී ස්ථාන 02 ක ලේඛනගත කඩ කාමර 26 ට අමතරව ඉදිකිරීම් 02 ක් සිදුකර ඇති බව නිරීක්ෂණය වූ අතර මෙවැනි ඉදිකිරීම් වලට ඉඩදීම සඳහා සභා අනුමැතියක් ලබාගෙන නොතිබුණි. සභාව විධිමත්ව ගිවිසුම්ගත වී එම කඩකාමර වලින් කුලී මුදල් අයකිරීමටද කටයුතු කර නොතිබුණි.

**2.2.6 සූරියවැව සතිපොළ කඩකාමර 07 බදුදීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 173 වගන්තිය අනුව බදුකරුවන් සමඟ ගිවිසුම්ගතවිය යුතු වුවත් ඉහත කඩ කාමර 07 හි බදුකරුවන් සමඟ ගිවිසුම්ගත වීමට විගණිත දිනය වූ 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

ii. එකතුව රු. 28,200 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

iii. අංක 06 හා 07 දරන කඩ කාමර බදුගත් බදුකරුවන්ගේ නම් හෝ හිඟ ශේෂයන් පිළිබඳව ලේඛනයේ සටහන් කර නොතිබීම නිසා එම කඩ කාමර 02 පිළිබඳව තොරතුරු විගණනයට අනාවරණය නොවීය.

iv. තක්සේරු දෙපාර්තමේන්තුවේ 2013 මැයි 23 දිනැති තක්සේරු වාර්තාව අනුව සංශෝධිත මාසික කුලිය රු. 750 ක් වුවද එම ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

v. ගිවිසුම් රහිත ඉහත කඩකාමර වෙනුවෙන් විගණිත දිනය වූ 2013 දෙසැම්බර් 31 දින වන විට රු. 925,952 ක මුදලක් එක්වන් මුදල් ලෙස අයවීමට තිබුණු අතර එම මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.7 සූරියවැව සතිපොළ කඩකාමර 12 බදුදීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගිවිසුම් යාවත්කාලීන නොකිරීම හා හිඟ කඩකාමර කුලී අයකර නොගැනීම**

පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින අංකය දපපා/පපාකො/ 2010/1 දරන චක්‍රලේඛයේ 05 ඡේදය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් මෙම කඩ කාමර 12 සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබූ අතර එකතුව රු. 2,400 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දිනට හිඟව පැවතියද මෙම හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**(ආ) නව තක්සේරු ගාස්තු අය නොකිරීම**

---------------------------------------

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2013 මැයි 23 දිනැති තක්සේරු වාර්තාව අනුව මාසික කුලිය රු. 600 ක් වුවද තක්සේරු වාර්තාවේ ගාස්තු අනුව අයකිරීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) බස් නැවතුම්පොළ අසල පිහිටි කඩකාමර 08 බදුදීම**

----------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. පළාත් පාලන කොමසාරිස්ගේ 2011 ජනවාරි 01 දින අංකය දපපා/පපාකො/2010/1 දරන චක්‍රලේඛයේ 05 ඡේදය අනුව සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. මෙම කඩකාමර 08 සඳහා අවසන් වරට ගිවිසුම් අත්සන් කර තිබුණේ 2008 දෙසැම්බර් 29 දිනදීය.

ii. එකතුව රු. 104,900 ක මුදලක් එක්වන් මුදල් ලෙස 2013 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු වුවත් එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. 2008 දෙසැම්බර් 29 දිනෙන් ආරම්භ වී රු. 3,000 බැගින් මාසික වාරික 42 ක් ගෙවිය යුතු වුවත් ඒ ආකාරයට ගෙවීම් සිදුකර නොමැති බවද නිරීක්ෂණය විය.

iii. කඩ කාමර වලින් වර්ෂය අවසානයට එකතුව රු. 12,900 ක කුලී මුදලක් හිඟව තිබූ අතර එම හිඟ කුලී මුදල් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

**2.2.8 වෙනත් ආදායම්**

------------------

2013 ජුලි සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 117,456 ක වීථි පහන් ප්‍රතිපූර්ණ ආදායම් විදුලිබල මණ්ඩලයෙන් අයවිය යුතුව තිබුණි.

**2.2.9 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,402,795 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්ය සාධන ඇගැයීම**

--------------------------

2013 වර්ෂයේ අයවැය ලේඛනය මගින් වර්ෂය තුල ක්‍රියාත්මක කිරීම සඳහා රු. 1,768,000 ක වටිනාකමට වූ වැඩයෝජනා 31 ක් ඉදිරිපත් කර තිබුණි. මෙම වැඩ යෝජනා වලින් 2013 නොවැම්බර් 21 දින වන විටත් ක්‍රියාත්මක කර තිබුණේ රු. 280,000 ක් වූ වැඩ යෝජනා 03 ක් පමණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------------**

ප්‍රාදේශීය සභාව මගින් ආදේශක පත්වීම් 06 ක් ලබාදී තිබූ අතර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4.1 ඡේදය අනුව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පත්වීම් ලබාදිය යුතු වුවත් එයට පටහැනිව සේවක අර්ථ සාධක අරමුදල් පත්වීම් ලබාදී තිබුණි.

3.3 අවිධිමත් ගනුදෙනු

-----------------------

දකුණු පළාත් පාලන කොමසාරිස්ගේ 1991 සැප්තැම්බර් 02 දිනැති අංක 91/12 දරන චක්‍රලේඛයේ 02 ඡේදය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල කරනු ලබන රාජකාරි ගමන් සඳහා සභාපතිවරයාට සංයුක්ත දීමනා ගෙවිය නොහැකි වුවද එකී විධිවිධානයට පටහැනිව සභා බල ප්‍රදේශය තුල කරනු ලැබූ රාජකාරි ගමන් සඳහා එකතුව රු. 31,750 ක සංයුක්ත දීමනා ගෙවා තිබුණි.

**3.4 නිෂ්ක්‍රීය වත්කම්**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආසියා පදනමෙන් ජංගම පුස්තකාලයක් පවත්වාගෙන යාම සඳහා රු. 156,874 ක් වටිනා උපකරණ 24 ක් 2007 ඔක්තෝබර් මාසයේදි පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අතර ජංගම පුස්තකාලය පවත්වාගෙන ගොස් තිබුණේ 2009 දෙසැම්බර් මාසය දක්වා පමණි. විගණිත දිනය වූ 2013 නොවැම්බර් මස 22 දින වන විටත් එම උපකරණ ඵලදායි කාර්යයකට යොදවා නොතිබුණි.
ආසියා පදනමෙන් පරිත්‍යාග වශයෙන් පොත් 2132 ක් ලබාදී තිබූ අතර 2009 දෙසැම්බර් මාසයෙන් පසුව පාඨකයින්ට පොත් නිකුත් කිරීම සිදුකර නොතිබුණි.

(ආ) වසර ගණනාවක සිට නිෂ්ක්‍රීයව පවතින වටිනාකම සොයාගත නොහැකි භාණ්ඩ වර්ග 5 කට අයත් නළ ළිං උපකරණ ඒකක 127 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභාවට අයත් අංක LE-7476 කැබ් රථය සහ අංක 270 – 0523 දරණ ට්‍රැක්ටරය අක්‍රීය තත්ත්වයේ තිබූ අතර එම වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට ක්‍රියාකර නොතිබුණි.

**3.5 හඳුනාගත් අලාභ**

**-------------------**

යෝජිත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ දැල් වැට ඉදිකිරීම සඳහා මිළදීගත් භාණ්ඩ වලින් විෂයයන් 25 ක් නැති වී තිබූ අතර ඒවායේ නැවත ප්‍රතිසම්පාදන පිරිවැය රු. 101,500 ක් විය. මෙම අලාභයට වගකිව යුතු පාර්ශවයන් 04 ක් හඳුනාගෙන තිබුණ ද නැති වූ භාණ්ඩ වල වටිනාකම විගණන දිනය වූ 2013 නොවැම්බර් 21 දින වන විටත් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**3.6 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

**(අ) ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ඉදිකිරීම**

**------------------------------------------**

2006 වර්ෂයේ ආරම්භ කරන ලද මෙම කර්මාන්තය අදියර 03 ක් යටතේ ඇස්තමේන්තු 03 ක් සකස් කර කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත ලබාදී එකතුව රු. 13,088,834 ක වියදමක් 2013 නොවැම්බර් 21 දින වන විට දරා තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගොඩනැගිල්ලේ ආලින්දය සකස් කිරීම සඳහා කොන්ක්‍රීට් කණු 08 ක් ඉදිකිරීම සඳහා රු. 376,295 ක වියදමක් දරා තිබුණි. මෙම කණු 08 න් වහලය සකස් කිරීම සඳහා කණු 06 ක් පමණක් භාවිතා කර තිබූ අතර කණු දෙකක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. නිවැරදි සැලසුමකින් තොරව ඉදිකිරීම් කටයුතු කිරීම නිසා කොන්ක්‍රීට් කණු 02 ක් සඳහා දරන ලද රු. 94,074 ක වියදම නිෂ්ඵල වියදමක් බවට පත්ව තිබුණි.

(ii). ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර වශයෙන් සිදුකිරීම නිසා දෙවන අදියරයේදී ඉටුකරනු ලැබූ පහත සඳහන් වැඩ කොටස් ප්‍රයෝජනවත් නොමැති තත්ත්වයකට පත්ව තිබූ අතර එම වැඩ කොටස් නැවත ඉටුකිරීමට සිදුව තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ collumes , beam , slab එකෙහි සුද මැදීම සඳහා රු. 216,268 ක වියදමක් දරා තිබුණි. 2013 නොවැම්බර් 21 දින භෞතික පරීක්ෂාවේදී කළු පුස් බැදී දුර්වර්ණ වී ඇති බව නිරීක්ෂණය විය.

(iv) ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම වෙනුවෙන් රු. 190,843 ක වියදමක් දරා තිබුණි. තෙවන අදියරේ ඉදිකිරීම් සහ නියමිත පරිදි නඩත්තු නොකිරීම නිසා ආලේප කර තිබූ තීන්ත දුර්වර්ණ වීම හා අපවිත්‍ර විම සිදුව තිබුණි.

(v). වර්ෂයක වගකීම් කාලයක් සහිතව CFL බල්බ් සහිත Pendent lamp සපයා සවිකිරීම වෙනුවෙන් ඒකක 56 ක් සඳහා රු. 99,120 ක් ගෙවා තිබුණද 2013 නොවැම්බර් 21 දින භෞතික පරීක්ෂාවේදී බල්බ් සවිකර නොමැති බව නිරීක්ෂණය විය. 2013 නොවැම්බර් 21 දින වන විටත් විදුලි බලය සපයා නොතිබූ අතර එසේ තිබියදී CFL බල්බ් සැපයීම වෙනුවෙන් ගෙවීම් කිරීමේ අවශ්‍යතාවය කුමක්ද යන්නද අනාවරණය නොවුනි.

(vi). ගොඩනැගිල්ලේ ඉහල මාලයේ බැද තිබූ කුමේර තැනින් තැන ගැලවී තිබුණි.

(vii) වැඩ අවසන් කර තිබූ පළමු මහල පවිත්‍රකර තබාගැනීමට කටයුතු කර නොතිබූ අතර ගොඩනැගිල්ල ඇතුළත දැඩි ලෙස අපවිත්‍ර වී තිබුණි.

(viii) 2006 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ මෙම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු විගණන දිනය වූ 2013 නොවැම්බර් 21 දින වන විටත් අවසන් වී නොතිබුණි.

**(ආ) සූරියවැව නගරයේ අලුතින් කඩකාමර 04 ක් ඉදිකිරීම**

සභා අරමුදල් උපයෝගී කරගෙන කඩකාමර දෙක බැගින් කඩකාමර 04 ක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව 2010 දෙසැම්බර් 09 දින එකතුව රු. 3,796,298 ක ගිවිසුම්ගත මුදලකට අනුමත සමිති දෙකක් වෙත පවරා තිබුණි. කොන්ත්‍රාත් සමිති විසින් රු. 1,419,128 ක වැඩ කොටස් නිමකර තිබූ අතර රු. 1,277,216 ක මුදලක් සමිති වෙත ගෙවා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනෙන් පසුව ඉදිකිරීම් කටයුතු අත්හැර දමා තිබූ අතර රු. 1,789,160 ක වැඩ කොටස් ඉටු කිරීමට තිබුණි. විගණන දිනය වූ 2013 නොවැම්බර් 21 වන දින වන විටත් මෙම කඩකාමර වල ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා සභාව විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබූ අතර කඩකාමර ඉදිකර තිබූ ස්ථාන වල් බිහි වී තිබුණි.

**3.7 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

ප්‍රාදේශීය සභාව විසින් ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා භූමිය තෝරාගැනීම හා දැල්වැට ඉදිකිරීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම පමණක් සිදුකර තිබූ අතර වැට ඉදිකිරීම සඳහා 2011 දෙසැම්බර් 30 දින රු. 1,065,900 ක් වැයකර මිලදීගත් භාණ්ඩ යොදාගෙන අදාල කාර්යය නිම කිරීමට 2014 අප්‍රේල් 25 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**4. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) සේවක ණය පරිපාලනය
(ඉ) වාහන පරිපාලනය